වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
පොල් සංවර්ධන අධිකාරිය

පොල් සංවර්ධන අධිකාරියේ දැනට පුරප්පාඩුව පවත්නා පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් හා පළපුරුද්ද ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

## 1. තනතුර -අධ්‍යක්ෂ (පාලන)

**තනතුරු සංඛ්‍යාව 01**

**සේවා ගණය :** ජ්‍යෙෂ්ඨ කළමනාකාර සේවා ගණය (HM 1-1)

**වැටුප් ක්‍රමය-** රු.80,295,/=15x2,270/=රු.114,345/- (HM1-1 2016) ( මාසික )+රජයේ අනුමත දීමනා

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද**

**බාහිර අයදුම්කරුවන් සඳහා**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක රාජ්‍ය පරිපාලනය/ව්‍යාපාර පරිපාලනය/කළමනාකරණය/නීතිය සම්බන්ධ ප්‍රථම උපාධියක් සමඟ අදාළ ක්ෂේත්‍රයක පශ්චාත් උපාධියක් ලබා තිබීම.

සමඟ

රජයේ හෝ රජය පිළිගත් ආයතනයක කළමනාකාර මට්ටමේ තනතුරක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 15 ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා**

පොල් සංවර්ධන අධිකාරියේ කළමනාකාර සේවා ගණයේ (MM 1-1) 1 වන ශ්‍රේණියේ වැටුප් පරිමාණය හිමි තනතුරක අදාළ ක්ෂේත්‍රයේ වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සමඟ ඉතා යහපත් සේවා වාර්තාවක් තිබීම.

**වයස** - අයදුම්පත් බාරගන්නා අවසාන දිනට අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 50 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

**බඳවා ගැනීමේ ක්‍රමවේදය -** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්

රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 1/2015 හා 1/2015(1) පරිදි ප්‍රවාහන පහසුකම් සපයනු ලැබේ.

## 2. අභ්‍යන්තර විගණක

**තනතුරු සංඛ්‍යාව 01**

**සේවා ගණය :** කළමනාකාර සේවා ගණය (MM 1-1)

**වැටුප් ක්‍රමය-** රු.53,175,/- 10x1,375/-, 15x1,910/-, රු.95,575/- (M M1-1 2016) (මාසික )+රජයේ අනුමත දීමනා

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද**

**බාහිර අයදුම්කරුවන් සඳහා**

i. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් ගණකාධිකරණ/වාණිජවේදී/ව්‍යාපාර පරිපාලන/රාජ්‍ය පරිපාලන/කළමනාකරණ උපාධියක් ලබා තිබීම.

හෝ

ii. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ මධ්‍ය පරීක්ෂණය/එංගලන්තයේ පිරිවැය සහ කළමනාකාරීත්ව ගණකාධිකරණ ආයතනයේ ඒ සහ බී යන කොටස් හා වෘත්තීය පළමුවන කොටස/ සහතිකලත් හා සංස්ථාපිත ගණකාධිකාරී ආයතනයේ මධ්‍යම පරීක්ෂණය (එංගලන්තයේ ) සමත්ව තිබීම

iii. ඉහත i හෝ ii හි සුදුසුකම් ලබාගැනීමෙන් පසු විගණන හෝ ගිණුම්කරණ කටයුතු පිළිබඳව අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර 03කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා**

i. පොල් සංවර්ධන අධිකාරියේ JM 1-2 සේවා ගණයේ වැටුප් පරිමාණය හිමි 11 වන ශ්‍රේණියේ තනතුරක අදාළ ක්ෂේත්‍රයේ වසර 05 කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් තිබීම.

හෝ

ii. පොල් සංවර්ධන අධිකාරියේ MA 3 වැටුප් පරිමාණය හිමි තනතුරක අදාල ක්ෂේත්‍රයේ වසර 05 කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් තිබීම සමඟ බාහිර අයදුම්කරුවන් සඳහා වන අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම

**වයස -** අයදුම්පත් බාරගන්නා අවසාන දිනට අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

**බඳවා ගැනීමේ ක්‍රමවේදය -** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**වෙනත්**

ඉහත තනතුරු සඳහා

**i.** ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
ii . තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
iii. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

**ප්‍රතිලාභ**

1. 1983 අංක 12 දරණපාරිතෝෂික පනත යටතේ පාරිතෝෂික දීමනා.
2. සේවක වෛද්‍ය රක්ෂණය හා පුද්ගල හදිසි අනතුරු රක්ෂණාවරණය/ කම්කරු වන්දි රක්ෂණය
3. සේවක අර්ථසාධක අරමුදල: සේවකයා 10% සේව්‍යයා 15% සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල සේව්‍යයා 3%
4. අධිකාරියේ සේවකයින්ට දෙනු ලබන අනෙකුත් ප්‍රතිලාභ

අයදුම්කරුවන්ගේ වර්තමාන රැකියාව, වැටුප් විස්තර, කලින් දරණ ලද තනතුරු, සේවය කරන ලද කාල සීමාව, සමඟ අයදුම්කරු පිළිබඳ තොරතුරු ලබා ගතහැකි ඥාති සම්බන්ධතාවයක් නොමැති පුද්ගලයන් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් ඇතුළත්ව අයදුම්කරුගේ සම්පූර්ණ විස්තර සහිතව පිළියෙල කරන ලද අයදුම්පත උප්පැන්න සහතිකය, අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් ද සමඟ ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට 2023.08.11 දින හෝ ඊට පෙර එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ තනතුර සඳහන් කළ යුතුය.

රජයේ දෙපාර්තමේන්තු/පළාත් රාජ්‍ය සේවය/රාජ්‍ය සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත් ආයතන ප්‍රධානී මගින් ද පොල් සංවර්ධන අධිකාරියේ ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත් අංශ ප්‍රධානීන් මඟින්ද එවිය යුතුය.

අයදුම්පත් එවිය යුතු අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත්, ඉහත සඳහන් සුදුසුකම් සහ සහතික පත් නොමැති හා දෙපාර්තමේන්තු /ආයතන ප්‍රධානීන් මඟින් යොමු කරනු නොලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මෙම දැන්වීම පොල් සංවර්ධන අධිකාරියේ වෙබ් අඩවියෙහිද පල කර ඇත. www.cda.gov.lk

සභාපති
පොල් සංවර්ධන අධිකාරිය
අංක 54, නාවල පාර,
නාරාහේන්පිට,
කොළඹ 05.